සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province Department of Education, Southern Province

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## තෙවන වාර පරීක්ෂණය - 2020
## Third Term Test - 2020

| 11 ශ්‍රේණිය<br>Grade 11 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I | පැය එකයි<br>One hour |
|---|---|---|

සැලකිය යුතුයි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ (X) ලකුණ යොදන්න.

01. සන්නිවේදන ක්‍රියාවලියට බාධාකාරී වන සාධක පිළිබඳ දක්වා ඇති සන්නිවේදන ආකෘතිය
(1) ෂැනන් - වීවර් ආකෘතියයි (2) ලැස්වෙල් ආකෘතියයි
(3) ද්විමාර්ගික සන්නිවේදන ආකෘතියයි (4) වයි ආකෘතියයි

02. මූලාශ්‍රය පැහැදිලිව හඳුනාගත නොහැකි සන්නිවේදන ස්වරූපය වන්නේ,
(1) වාචික සන්නිවේදනයයි (2) විධිමත් සන්නිවේදනයයි
(3) අවිධිමත් සන්නිවේදනයයි (4) නිර්වාචික සන්නිවේදනයයි

03. සා/පෙළ විභාග සම්මන්ත්‍රණයේ දී අවධානය යොමු කළ විශේෂ කරුණු සියල්ල සාරාංශගත කර එදිනම තුන්සියක් (300) වූ සිසුන් අතට පත් කිරීමට දේශකතුමාට අවශ්‍ය විය. මේ සඳහා ඔහු භාවිත කළ යුතු මාධ්‍ය උපකරණය වන්නේ,
(1) ඩිජිටල් ඩුප්ලිකේටරයයි (2) ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍රයයි
(3) ලේසර් මුද්‍රණ යන්ත්‍රයයි (4) ඡායා පිටපත් යන්ත්‍රයයි

04. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල සිදුවන වනඅලි ප්‍රහාරයන් හා සහනාධාර නොලැබීම් ආදී පුවත් ජාතික තලයට ගෙන එන මාධ්‍යවේදීන් හඳුන්වන්නේ,
(1) මාණ්ඩලික මාධ්‍යවේදීන් ලෙසය (2) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් ලෙසය
(3) ඡායාරූප මාධ්‍යවේදීන් ලෙසය (4) සංස්කරණ මාධ්‍යවේදීන් ලෙසය

05. ස්ත්‍රී - පුරුෂ සමාජභාවය,
(1) සමාජ විද්‍යාත්මක සංකල්පයකි
(2) ජනමාධ්‍ය සංකල්පයකි
(3) සමාජ ගැටුම් පිළිබඳ සංකල්පයකි
(4) සංවර්ධනය වෙමින් පවතින රටවල ක්‍රියාත්මක සංකල්පයකි

06. ලොව ප්‍රථම කුඩා ජංගම කැමරාව නිපදවූයේ,
(1) ජෝර්ජ් ඊස්ට්මන්ය (2) විලියම් ෆොක්ස් ටැල්බොට්ය
(3) ලුයිස් මැන්ඩේ ඩිගියුරේය (4) ජොසොප් නිසෙපේර්ය

07. "සෑම උද්වේගකර ආරංචියක්ම ප්‍රවෘත්තියකි..........." මෙම අර්ථ දැක්වීම සිදු කළේ,
(1) මිල්ටන් බ්‍රෂ්ය (2) චාල්ස් ඇන්ඩර්සන් ඩානාය
(3) පෝල් D මැසිනියර්ය (4) විල්බර් ශ්‍රාම්ය

08. "පිටු (49) කට නොඅඩු වාර සඟරා හෝ මුද්‍රිත කඩදාසි ගොනුව................" හඳුන්වන්නේ,
(1) සඟරාව යන නාමයෙනි (2) පෝස්ටරය යන නාමයෙනි
(3) ග්‍රන්ථ යන නාමයෙනි (4) පුවත් පත් යන නාමයෙනි

09. සාර්ථක ඡායාරූපයක ලක්ෂණයක් නොවන්නේ,
(1) නිසි මොහොත සටහන් වී තිබීමයි (2) නිවැරදි රාමුව ඇතුළත් වී තිබීමයි
(3) අධික හෝ මන්ද හෝ අනාවරණය වී තිබීමයි (4) ක්ෂේත්‍ර ගැඹුර පාලනය වී තිබීමයි

10. රූපවාහිනී කාටූන් වැඩසටහනක් නරඹමින් සිටි අමරාට එහි වූ කාටූන් චරිතයක මුහුණ තම සහෝදරයාගේ මුහුණුවරට සමාන බව හැඟුණි. මෙයට අදාළ සන්නිවේදන වර්ගය වන්නේ,
(1) ජනසන්නිවේදනයයි (2) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයයි
(3) දෘශ්‍ය සන්නිවේදනයයි (4) පුද්ගලාන්තර සන්නිවේදනයයි

11. ඕනෑම නිර්මාණයක ගුණාංග බොහෝමයක් අන්තර්ගත වේ. එම ගුණාංග වලට අයත් **නොවන්නේ**,
(1) නැවුම් බවය (2) කැපී පෙනීමය
(3) අර්ථ සම්පන්න බවය (4) සියුම් ලෙස සිතීමේ හැකියාවය

12. රූපවාහිනී ළමා වැඩසටහන් අතරතුර රස කැවිලි පිළිබඳ දැන්වීම් වැඩිපුර ප්‍රචාරය වන බව දක්නට ලැබුණි. මෙයින් ගම්‍ය වන්නේ එම නාලිකාව,
(1) ළමයින්ගේ මුඛ සෞඛ්‍ය පිළිබඳ අඩු සැලකිල්ලක් දක්වන බවය
(2) වැඩසටහන් වල ඒකාකාරී බව බිඳීමට දැන්වීම් යොදා ගන්නා බවය
(3) ළමයින් වඩාත් කැමති දෑ පෙන්වීමට උත්සුක වන බවය
(4) පාරිභෝගිකයන් ලෙස ළමයින්ගේ වටිනාකම හඳුනාගෙන ඇති බවය

13. "පාසැලේ පැවති ජනමාධ්‍ය සම්මන්ත්‍රණයේ දී දේශකවරුන් විසින් විවිධ සටහන් සිසුන්ට ලබා දී, ඇතැම් අවස්ථාවල රූප සටහන් ද ඇඳ, කරුනු පැහැදිලි කරමින් දේශන පවත්වන ලදී...." ඉහත ප්‍රකාශයේ අන්තර්ගතය සන්නිවේදන ස්වරූප අනුපිළිවෙළ තෝරන්න.
(1) විධිමත් - ලිඛිත - දෘශ්‍ය - වාචික (2) ලිඛිත - දෘශ්‍ය - වාචික - ශ්‍රව්‍ය
(3) වාචික - ලිඛිත - දෘශ්‍ය - විධිමත් (4) වාචික - ශ්‍රව්‍ය - දෘශ්‍ය - ලිඛිත

14. මිනිසා හා තොරතුරු අතර වූ සම්බන්ධය පිළිබඳව සා/පෙළ සිසුන් සිව් දෙනෙක් පළකල අදහස් මෙසේය.
A - විවිධ පුද්ගල අවශ්‍යතා සපුරාලීමට තොරතුරු අවශ්‍ය වේ.
B - සමාජීය හා ආයතනික තීන්දු ගැනීමට තොරතුරු අවශ්‍ය වේ.
C - පුද්ගල හා සමාජීය ගැටලු නිරාකරණය කර ගැනීමට ද තොරතුරු අවශ්‍ය වේ.
D - නිර්මාණශීලී චින්තනය වර්ධනය කර ගත හැකි ප්‍රධානම මාර්ගය තොරතුරු පද්ධතියක් තිබීමයි.
මේ අතුරින් **නිවැරදි** ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ,
(1) A හා B පමණි. (2) C හා D පමණි.
(3) A,B,C හා D යන සියලු දෙනාගේ අදහස් සත්‍ය වේ. (4) A,B,C හා D යන සියලු දෙනාගේ අදහස් අසත්‍ය වේ.

15. ඔබගේ පන්තිකාමරය තුළ භාවිත කළ හැකි ප්‍රක්ෂේපණ යන්ත්‍රයක දක්නට ලැබෙන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
A - යන්ත්‍රය තුළ අධිබලැති විදුලි බුබුලක් භාවිතා වේ.
B - ස්කෑන් කිරීමට කැමරා පද්ධතියක් ඇත.
C - ඩිජිටල් ක්‍රම භාවිත කරන නිසා පූර්ව සූදානම් කිරීම් අවශ්‍ය නැත.
මෙම ලක්ෂණ සියල්ල සහිත ප්‍රක්ෂේපණ යන්ත්‍රය වන්නේ,
(1) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි (2) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි
(3) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි (4) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි

16. "**පැන්තස් මැගෝරියා**...................." යනු,
(1) චිත්‍රපට ශාලා විශේෂයකි.
(2) ප්‍රක්ෂේපණ නොවන මාධ්‍ය උපකරණ විශේෂයකි.
(3) භූතයෝ / අවතාර වැනි දේ ප්‍රදර්ශනය කළ දර්ශන විශේෂයකි.
(4) වීඩියෝ කැමරා විශේෂයකි.

17. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ **(19)** වන වගන්තියෙහි අන්තර්ගත අයිතිවාසිකම් කිහිපයක් පහත දැක්වේ.
A - තම නිදහස් මතය දැරිය හැකිය
B - තම නිදහස් මතය ප්‍රකාශ කළ හැකිය
C - දේශ සීමා නොසලකා කවර මාධ්‍යයකින් හෝ තොරතුරු ලැබීමට හා දීමට හැකිය
ඉහත තත්ත්වය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (1978) 14 (1) (අ) අනු ව්‍යවස්ථාව හා සැසඳීමේ දී සමානතාවක් දක්වන්නේ,
(1) A සමග පමණකි. (2) B සමග පමණකි. (3) C සමග පමණකි. (4) A හා B සමග පමණකි.

18. ජීවදත්ත පත්‍රිකාවක් සැකසීමේ දී අනුගමනය **නොකළ** යුත්තේ පහත කරුණු වලින් කුමක් ද?
(1) කඩදාසියේ තනි පැත්තක් පමණක් භාවිතා කිරීම (2) කුසලතා හා දුබලතා නොසඟවා ඉදිරිපත් කිරීම
(3) මූලික තොරතුරු කෙටියෙන් දැක්වීම (4) මාතෘකා හා අනුමාතෘකා තද කළු අකුරින් තැබීම

19. සමාජ ප්‍රතිරූපය පිළිබඳ **නිවැරදි** තක්සේරුව වන්නේ,
(1) හුදු විශ්වාසයක් ලෙස පමණක් සැලකිය හැකි වීමයි.
(2) සොරුන් - දාමරිකයන් වැන්නන් නිසා ද බිහි වීමට ඉඩ තිබීමයි.
(3) සමාජය මත හැමවිටම ධනාත්මක ප්‍රතිඵල ගෙන දීමයි.
(4) ජනමාධ්‍ය පදනම් කොට ගෙනම ගොඩ නැගෙනු දක්නට ලැබීමයි.

20. ඉතාම නිවැරදිව කැමරාවක තාක්ෂණය භාවිත කළ ද, එක්තරා සේයා පටලයකින් ගත් ඡායාරූප වල අනාවරණය වෙනස් වී ලප ආදීය මතු වී විනාශ වී තිබුණේය. ඊට ආසන්නතම හේතුව විය හැක්කේ එම සේයා පටලය
(1) කල් ඉකුත් වූ එකක් වීමයි (2) ආලෝකයට අනාවරණය වී තිබීමයි
(3) නිශ්පාදනයේ දී ම දෝෂ සහගත වීමයි (4) අදාළ පරිසරයට නුසුදුසු එකක් වීමයි

21. මෙරට ගුවන් විදුලි සේවයේ පළමු සිංහල නිවේදකයා වූයේ,
(1) කරුණාරත්න අබේසේකර මහතාය (2) ඩී.එම්. කොළඹගේ මහතාය
(3) ප්‍රේමකීර්ති ද අල්විස් මහතාය (4) රොෂාන් වටවල මහතාය

22. පාසැලේ වාර්ෂික ප්‍රදර්ශනයට ඉදිරිපත් කරන නව නිර්මාණය පිළිබඳ සිතමින් සිටි නිමල් තම අදහස ගුරුතුමා හමු වී ප්‍රකාශ කළේය. නිමල්ගේ අදහස පන්ති කාමරයේ දී අගය කළ ගුරුතුමා, සෙසු දරුවන්ටත් ඒ ආකාරයෙන් කටයුතු කරන ලෙස දැන්වීය. මේ සිදුවීම්වල සන්නිවේදන වර්ග අනුපිළිවෙල වන්නේ,
(1) අන්තර්වර්ති - පුද්ගලාන්තර - සමූහ සන්නිවේදනය (2) පුද්ගලාන්තර - සමූහ - ජනසන්නිවේදනය
(3) පුද්ගලාන්තර - අන්තර්වර්ති - සමූහ සන්නිවේදනය (4) අන්තර්වර්ති - සමූහ - පුද්ගලාන්තර සන්නිවේදනය

23. චරිතාපදාන අයත්වන තොරතුරු මූලාශ්‍ර වර්ගය වන්නේ,
(1) පුද්ගල මූලාශ්‍රයයි (2) ආයතනික මූලාශ්‍රයයි (3) මාධ්‍ය මූලාශ්‍රයයි (4)ලිඛිත මූලාශ්‍රයයි

24. දුලිත මිලදී ගත් පොතක පිට කවරයේ පහළ කොටසේ පහත අංකනය සටහන් වී තිබුණි.

| ISBN : 955 - 8663 - 05 - 0 |
|---|

මෙම අංකනය ලබාදෙන ආයතනය
(1) විදුලි සන්දේශ නියාමන කොමිසන් සභාවයි (2) පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයයි
(3) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයයි (4) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයයි

25. අන්තර් පුද්ගල සන්නිවේදනය වනාහි,
(1) කථන හා ශ්‍රව්‍ය සන්නිවේදනයේ එකතුවකි (2) වාචික හා අවාචික සන්නිවේදනයේ එකතුවකි
(3) දෘශ්‍ය හා වාචික සන්නිවේදනයේ එකතුවකි (4) රූපණ හා විධිමත් සන්නිවේදනයේ එකතුවකි

26. එක්තරා මාධ්‍ය උපකරණයක් සතු හැකියාවන් පහත පරිදි ය.

- එක ආරම්භක ස්ථානයකින් වැඩි ගමනාන්ත සංඛ්‍යාවකට සංදේශ යැවීමට හැකි වීම
- කෙටි ලිඛිත / සංඥා යැවීමට හැකි වීම
- ලබාදෙන සංඥාව නිශ්චිත වේ. මේ නිසාම වන ප්‍රතික්‍රියා දක්විය හැක.

මෙම ලක්ෂණ පෙන්වන මාධ්‍ය උපකරණය විය හැක්කේ,
(1) විද්‍යුත් කැඳවනය (පේජරය) (2) මුදල් සටහන් යන්ත්‍රය (3) පියවූ පරිපථ කැමරාව (4) ස්ථාවර දුරකථනය

27. පහත දැක්වෙන්නේ ටෙලිනාට්‍ය නිෂ්පාදනයට දායකත්වය සපයන විවිධ පුද්ගලයන් හා අවස්ථා අයත් වන කාණ්ඩ තුනකි.
A - අධ්‍යක්ෂකවරයා - ආලෝක කරණ ශිල්පි - වේශ නිරූපණ ශිල්පී
B - කථාව - තිර රචනය - තිර රචකයා
C - සංස්කාරක - ග්‍රැෆික් නිර්මාණකරු - හඬ කවන ශිල්පි
පිළිවෙලින් ඉහත කාණ්ඩ **තුන** අයත් වන අංශ වනුයේ,
(1) පූර්ව නිෂ්පාදනය - නිෂ්පාදනය - පසු නිෂ්පාදන අංශවලටය
(2) පූර්ව නිෂ්පාදනය - පසු නිෂ්පාදනය - නිෂ්පාදන අංශවලටය
(3) පසු නිෂ්පාදනය - නිෂ්පාදනය - පූර්ව නිෂ්පාදන අංශවලටය
(4) නිෂ්පාදනය - පූර්ව නිෂ්පාදනය - පසු නිෂ්පාදන අංශවලටය

28. ප්‍රාග් මුද්‍රිත මාධ්‍ය ස්වරූපයකි,
(1) ලන්ඩන් ගැසට් පුවත්පතය (2) ලාගැසතේ පුවත්පතය
(3) ඇක්ටා ඩියුර්නා නම් රාජ්‍ය නිවේදනය (4) බෙංගාල් ගැසට් පුවත්පත

29. යටිකුර පිරමිඩ ආකෘතිය අනුගමනය කිරීමේදී මුලින්ම හමුවන්නේ,
(1) ප්‍රවෘත්ති මුලපාඨයයි (2) ප්‍රවෘත්ති දේහයයි
(3) ප්‍රවෘත්තියේ අඛ්‍යාත කොටසයි (4) ප්‍රවෘත්ති සිද්ධියකි

30. මිනිසාගේ පියවි ඇසට පෙනෙන දර්ශනයට සමීප දර්ශන ලබා ගැනීමට ඡායාරූප ශිල්පියෙකුට අවශ්‍ය කර තිබේ. ඒ සඳහා වඩාත් සුදුසු කාච වර්ගය.
(1) යුහුඹු කාචයයි (2) සාමාන්‍ය කාචයයි (3) දුර රූප කාචයයි (4) පුළුල් කෝණ කාචයයි

31. මෘදු පුවත් සම්බන්ධව (11) ශ්‍රේණියේ සිසුන් තිදෙනෙකු කරන ලද ප්‍රකාශ පහත දැක්වේ.
A - මෘදු පුවත් වැඩි දෙනෙකුට බලපෑම් කරයි
B - නිර්මාණශීලී භාෂාවක් යොදා ගන්නා අතර, වැඩි දෙනෙකුගේ අවධානය දිනා ගනී.
C - මෘදු පුවත් ජාතික වැදගත් කමක් උසුලන අතර, එය ඇතුළු පිටුවල පළවේ.
මේ අතුරින් නිවැරදි / සත්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ,
(1) A පමණි (2) B පමණි (3) C පමණි (4) සියලු දෙනාගේ ප්‍රකාශ අසත්‍ය වේ.

32. මානව ධර්මතා සම්බන්ධයෙන් වූ **නිරවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
    (1) මානව ධර්මතා ලෝක සමාජයේ පැවැත්මට එතරම් බලපෑමක් නොකරනු ඇත.
    (2) පුද්ගල රැකවරණය සැලසීමක් මානව ධර්මතාවලින් ඉටු නොවනු ඇත.
    (3) හොඳ - නරක යනු නිරපේක්ෂ දෙයකි
    (4) මානව ධර්මතා සුරැකීම පුරවැසියාගේ යුතුකමකි.

33. ඕනෑම රජයක් ජනමාධ්‍යයකින් බලාපොරොත්තු වන්නේ,
    (1) මහජන මතය රජයට හිතකරව පවත්වාගෙන යාමට සහය දීමය
    (2) රාජ්‍ය ප්‍රතිපත්ති සැමවිටම විවේචනය කිරීමය
    (3) විරුද්ධ පක්ෂවල ක්‍රියාවන් සැමවිටම විවේචනය කිරීමය
    (4) නීතියට වඩා ආචාර ධර්මවලට අනුකූලව ක්‍රියා කිරීමය

34. ග්‍රාහකයාගේ චර්යාව හා ආකල්ප කාලීනව වෙනස් කිරීමට බලපෑම් කළ යුතුය. මේ සඳහා සන්නිවේදකයා උචිත මාධ්‍ය නාලිකා භාවිත කර සන්දේශ බෙදා හැරිය යුතුය........... මේ අදහසට අනුරූපවන සන්නිවේදනය පිළිබඳ අර්ථ දැක්වීම ඉදිරිපත් කළේ.
    (1) මිල්ටන් බ්‍රෂ්ය (2) පෝල් D මැසිනියර්ය (3) හැරල් D ලැස්වෙල්ය (4) විල්බර්ශ්‍රාම්ය

35. විචාරශීලී ග්‍රාහකයෙක් විසින් සැලකිල්ලට ගත යුතු කරුණු පිළිබඳව සිසු සිසුවියන් ඉදිරිපත් කළ අදහස් කිහිපයක් පහත දැක්වේ.
    A - සන්දේශයේ ප්‍රබලතාවයට බලපෑ හේතු
    B - සන්නිවේදකයාගේ පසුබිම් තොරතුරු
    C - සංදේශය ඉදිරිපත් කළ හේතුව
    D - සමාජ දේශපාලන වටපිටාව
    ඉහත කරුණු අතුරෙන්,
    (1) A හා C පමණක් සත්‍ය වේ. (2) B හා C පමණක් සත්‍ය වේ.
    (3) A, B හා C පමණක් සත්‍ය වේ. (4) A, B, C හා D යන සියල්ලම සත්‍ය වේ.

36. දෙවන ලෝක මහා සංග්‍රාමයේ දී පණිවිඩ හුවමාරුවට යොදා **නොගත්** මාධ්‍ය මෙවලම වන්නේ,
    (1) පරවියන් මගින් තොරතුරු හුවමාරු කිරීමය
    (2) පියවූ පරිපථ කැමරා මගින් තොරතුරු හුවමාරු කිරීමයි
    (3) මුද්‍රිත පත්‍රිකා මගින් තොරතුරු හුවමාරු කිරීමයි
    (4) ගුවන්විදුලි තරංග මගින් තොරතුරු හුවමාරු කිරීමයි

37. රූපවාහිනිය සම්බන්ධයෙන් වූ **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
    (1) රූපවාහිනිය ශ්‍රව්‍ය - දෘශ්‍ය සන්නිවේදනයට අයත් මාධ්‍යයකි
    (2) ව්ලැඩිමීර් ස්වෛරීකින් ගේ රූප නිපදවීමේ තාක්ෂණය සොයාගැනීම මෙම මාධ්‍ය බිහිවීමට දායක වී ඇත
    (3) රූපවාහිනි මාධ්‍ය ස්ථායි මාධ්‍යයකි
    (4) සෑම වර්ෂයකම නොවැම්බර් 21 දිනය ලෝක රූපවාහිනි දිනය ලෙස නම් කර ඇත.

38. ප්‍රකාශන හිමිකම ලංකාවේ ක්‍රියාත්මක කිරීමට අදාල පනත වන්නේ,
    (1) 2003 අංක 36 දරණ බුද්ධිමය දෙපළ පනතයි (2) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයයි
    (3) 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනතයි (4) 1995 අංක 11 දරණ බේරුම්කරණ පනතයි

39. තොරතුරු රැස්කරන්නකු තුළ තිබිය යුතු ගුණාංගයකි, විචක්ෂණ බව. මෙයින් අදහස් වන්නේ,
    (1) තොරතුරු දැන ගැනීමේ උපායමාර්ගික බවය
    (2) තොරතුරු දැනගැනීමේ දී තියුණු නුවණ හා විචාර පූර්වක බව යොදා ගැනීමය
    (3) තොරතුරු දැනගැනීමේ දී අනෙකා සමග වූ සුහද බවය
    (4) තොරතුරු දැන ගැනීමේ දී භාවිත නිරීක්ෂණ ක්‍රම වේදය

40. සම්බන්ධවන සියලු දෙනාටම අන්තර්ක්‍රියාකාරී ලෙස තොරතුරු හුවමාරු කර ගැනීමට හා සංස්කරණයට හැකියාව ඇති, පරිගණක වැනි බහු මාධ්‍ය උපකරණ ආශ්‍රිතව භාවිත වන මාධ්‍ය විශේෂය,
    (1) සම්ප්‍රදායික මාධ්‍ය නම් වේ. (2) ජනමාධ්‍ය නම් වේ
    (3) නව මාධ්‍ය නම් වේ (4) මහජන මාධ්‍ය නම් වේ (ලකුණු 1 x 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Educ

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## තෙවන වාර පරීක්ෂණය - 2020
## Third Term Test - 2020

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>Grade 11 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II | පැය දෙකයි<br>Two hours |

සැලකිය යුතුයි.

- **පළමුවැනි ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද, ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමි වේ.**

(01) **කෙටි පිළිතුරු සපයන්න.**

කොවිඩ් - (19) රෝගය නිසා ලබාදුන් විශේෂ පාසැල් නිවාඩු කාලයේ දී පාසැල් සිසුන්ට ජනමාධ්‍ය ප්‍රවෘත්ති ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ හා කාටුන් චිත්‍ර නිර්මාණය කර නව මාධ්‍ය හා අන්තර්ජාලය උපයෝගී කරගෙන ඉදිරිපත් විය හැකි තරඟයක් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සංවිධානය කරන ලදී. පසු දිනක ජයග්‍රාහකයන්ට ත්‍යාග ප්‍රදානය කිරීමේ ඡායාරූපයක් සහිත පුවත්පත් වාර්තාවක් ද ජාතික පුවත්පතක පළවිය.

(i) ජනමාධ්‍ය ප්‍රවෘත්ති ප්‍රකාශ අයත්වන සන්නිවේදන **වර්ගය** නම් කරන්න.

(ii) කාටුන් චිත්‍ර අයත්වන සන්නිවේදන **ස්වරූපය / විධිය** නම් කරන්න.

(iii) ඉහත (i) හි දැක්වූ සන්නිවේදන ප්‍රභේදයේ මූලික ලක්ෂණ **දෙකක්** ලියා දක්වන්න.

(iv) නව මාධ්‍ය වල මූලික ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(v) මෙවැනි තරඟයක් පිළිබඳව ග්‍රාහක ප්‍රතිචාර ලබාදිය හැකි නව මාධ්‍ය වර්ග **දෙකක්** දක්වන්න.

(vi) ප්‍රවෘත්තිමය ඡායාරූපයක් ලබා ගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(vii) මෙවැනි තරඟ මගින් සිසුන්ගේ සෞන්දර්යාත්මක චින්තනය වර්ධනය වන ආකාරයන් **දෙකක්** ලියා දක්වන්න.

(viii) අන්තර්ජාල භාවිතය සෙසු මාධ්‍ය භාවිතයන්ට වඩා වාසි දායක වන ආකාර **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(ix) විනිශ්චය මණ්ඩලයට සිසුන් අඳින ලද කාටුන් චිත්‍ර ප්‍රදර්ශනය කළේ බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය ආධාරයෙනි. OHP යන්ත්‍රය හා බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය (Multi Media Projector) අතර **සමානතාවයක්** හා **අසමානතාවක්** වෙන වෙනම සඳහන් කරන්න.

(x) නව මාධ්‍ය භාවිත කරන ඔබ අනුගමනය කළ යුතු ආචාර ධර්ම **දෙකක්** ලියා දක්වන්න.

(ලකුණු $2 \times 10 = 20$)

(02) අමරා තම පාසැල් මිතුරියක වන ලක්ෂ්මීට දුරකථනයෙන් කථා කොට තමාට මග හැරුණු ශ්‍රව්‍ය - දෘශ්‍ය ආධාරක සහිත පාඩමක් පිළිබඳ කරුණු විමසා සිටියාය.

(i) දෘශ්‍ය සන්නිවේදනයේ මූලික ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 01)

(ii) සුහුරු ජංගම දුරකථනය බහු කාර්ය උපකරණයක් වන ආකාරයන් **දෙකක්** කෙටියෙන් පෙන්වා දෙන්න. (ලකුණු 02)

(iii) ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට ශ්‍රව්‍ය - දෘශ්‍ය ආධාරක යොදා ගැනීමේ වාසි සහගත බව කරුණු **තුනක්** ඇසුරින් සනාථ කරන්න. (ලකුණු 03)

(iv) අමරා තම පාසැල් මිතුරියට කථා කිරීමේදී භාවිත වන සන්නිවේදන ප්‍රභේදයේ විශේෂතා **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04)

(03) ඔබ මිතුරෙකු සමග දුරකථනයෙන් කථා කරන විට දුරකථන සංඥා හරහා පණිවිඩය හුවමාරු වන අතර, එකී සංඥා ගලායාමේදී පණිවිඩය මිතුරාට නිසි පරිදි ශ්‍රවණය නොවන අවස්ථා ද දක්නට ලැබුණි.

(i) ඉහත සන්නිවේදන ක්‍රියාවලිය විස්තර කිරීමට භාවිත කළ හැකි සන්නිවේදන ආකෘතිය නම් කරන්න. (ල. 01)

(ii) ඡේදය සඳහන් පරිදි පණිවිඩය නිසි පරිදි ශ්‍රවණය **නොවීමට** හේතු වන කාරණය සන්නිවේදන විද්‍යාත්මක ව පැහැදිලි කරන්න. (ල. 02)

(iii) දුරකථන සංඥා බාධක වලට අමතරව, පුද්ගල සංජානනය ද පණිවිඩ ග්‍රහණය කරගැනීමට බාධාවක් වේ. ඕනෑම ග්‍රාහකයකුගේ සංජානනයට බාධා පමුණුවන සාධක **තුනක්** නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 03)

(iv) පණිවිඩ ග්‍රාහකයාට ගලායාමට බාධාකාරී වන සාධකයක් ලෙස දොරටුපාල සංකල්පය දැක්විය හැක. දොරටුපාල සංකල්පය අනුගමනය කිරීම නිසා පණිවිඩයක් තුළ ඇති විය හැකි වෙනස් කම් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04)

(04) ලංකාවේ සමහර මාධ්‍ය ජාලා මුද්‍රිත හා විද්‍යුත් යන ජනමාධ්‍ය ප්‍රභේද දෙකට අයත් මාධ්‍ය පවත්වාගෙන යයි.

(i) ගුවන් විදුලි මාධ්‍ය සතු ප්‍රබලතා **දෙකක්** නම් කරන්න. (ලකුණු 01)

(ii) මුද්‍රිත මාධ්‍යයට පුවත්පතද අයත් වේ. පුවත්පතේ අන්තර්ගතයේ විශේෂතා **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

(iii) ඉහත මාධ්‍ය ජාලා පවත්වාගෙන යන රූපවාහිනි සේවාවන් ශ්‍රී ලංකීක සමාජයට කර ඇති කරන බලපෑම් **තුනක්** පෙන්වා දෙන්න. (ලකුණු 03)

(iv) " ජනමාධ්‍යයෙන් ඉටුකරගත හැකි සන්නිවේදන අරමුණු..........." මැයින් කරුණු **හතරක්** පදනම් කරගෙන ඉරුදින පුවත්පතකට වචන 100 කට නොඅඩු විශේෂාංග ලිපියක් රචනා කරන්න. (ලකුණු 04)

(05) (i) මුද්‍රිත හා විද්‍යුත් පුවත්පත් වල දැකිය හැක්කේ පොදු ලක්ෂණයන්ය. ඔබ මේ ප්‍රකාශයට එකඟවේ ද? කරුණු **දෙකක්** සඳහන් කරමින් ඔබගේ ප්‍රකාශය සනාථ කරන්න. (ලකුණු 01)

(ii) කාර්යාලයක කඩදාසි ලිපි ගොනු පවත්වාගෙන යාමට වඩා web අඩවියක් පවත්වා ගෙන යාම වාසි සහගතය. ඔබ මේ ප්‍රකාශයට එකඟවේ ද? කරුණු **දෙකක්** සඳහන් කරමින් ඔබගේ ප්‍රකාශය සනාථ කරන්න. (ලකුණු 02)

(iii) මාධ්‍ය ග්‍රාහක විවිධතා ඇතිවීම මායාවකි. ඔබ මේ ප්‍රකාශයට එකඟ වේද? කරුණු **තුනක්** ඇසුරු කරගෙන පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iv) පටල සේයා කැමරාවක ඡායාරූප වලට වඩා ඩිජිටල් කැමරාවක ඡායාරූප වඩා ඵලදායි වේ. ඔබ මේ ප්‍රකාශයට එකඟවේ ද? කරුණු **හතරක්** ඇසුරු කරගෙන ඔබගේ ප්‍රකාශය සනාථ කරන්න. (ලකුණු 04)

(06) එක්තරා කාන්තා පුවත්පතක පළ කිරීමට වරුණ නම් ඡායාරූප මාධ්‍යවේදියා සුරූපී නිලියක් ඉවුම් පිහුම් කරන ආකාරය ඡායාරූපයක් ලබා ගන්නා ලදී.

(i) ඉහත විස්තරයේ සුරූපී නිලිය නිරූපණය වන ආකාරය අධ්‍යයනය සඳහා වැදගත් වන සංකල්පය නම් කරන්න. (ලකුණු 01)

(ii) ඉහත සඳහන් කාන්තා පුවත්පත සඳහා නිර්මාණාත්මක ලිපි සපයන මාධ්‍යවේදියකු උඩුකුරු පිරමිඩ ආකෘතිය යොදා ගත යුතු ආකාරය විස්තර කරන්න. (ලකුණු 02)

(iii) වරුණ නම් ඡායාරූප මාධ්‍යවේදියා ලබාගෙන ඇති ඡායාරූපය ''**වාර්තාකරණ ඡායාරූපයක්**'' බව පුවත් සංස්කාරක පවසන ලදී. වාර්තාකරණ ඡායාරූපයක් ලබාගැනීමේදී සැලකිය යුතු සාධක **තුනක්** විස්තර කරන්න. (ලකුණු 03)

(iv) වරුණ ලබාගන්නා නිශ්චල ඡායාරූප භාවිතය නිසා මුද්‍රිත මාධ්‍යයට ලැබෙන වාසි **හතරක්** සවිස්තරව දක්වන්න. (ලකුණු 04)

07 පාසලේ සාහිත්‍ය උත්සවයේදී ''**ශිෂ්‍යයා හා මාධ්‍ය විචාර ක්‍රම**'' මැයින් කථාවක් පැවැත්වීමට ඔබට පැවරී ඇත.

(i) එම අවස්ථාවේ දී ඔබ යොදාගන්නා සන්නිවේදන වර්ගයේ / ප්‍රභේදයේ විශේෂතා **දෙකක්** නම් කරන්න. (ලකුණු 01)

(ii) ඉහත අවස්ථාවේදී ඔබගේ කථාවේ **සාර්ථක හා අසාර්ථක** බවට බලපාන සාධක **එක** බැගින් **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

(iii) ''**මාධ්‍ය විචාරයේ අවශ්‍යතාව**'' මැයින් කරුණු **තුනක්** ඇසුරු කරගෙන වචන **100** නොඅඩු තීරු ලිපියක් සකසන්න. (ලකුණු 03)

(iv) ශිෂ්‍යා විචාරශිලී ග්‍රාහකයෙක් වීමේ වැදගත්කම් **හතරක්** පෙන්වා දෙන්න. (ලකුණු 04)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 1) | 02. (3 ) | 03. ( 1) | 04. (2 ) | 05. ( 1 ) | 06. ( 1 ) | 07. ( 1 ) | 08. (3 ) | 09. (3 ) | 10. ( 2) |
| 11. (2 ) | 12. (4 ) | 13. ( 2) | 14. (3 ) | 15. (2 ) | 16. (3 ) | 17. (4 ) | 18. (2 ) | 19. (2 ) | 20. ( 1) |
| 21. (2 ) | 22. ( 1) | 23. ( 4) | 24. (3 ) | 25. (2 ) | 26. ( 1) | 27. ( 4) | 28. (3 ) | 29. ( 1) | 30. ( 2) |
| 31. (2 ) | 32. (4 ) | 33. ( 1) | 34. (3 ) | 35. (4 ) | 36. (2 ) | 37. (3 ) | 38. ( 1 ) | 39. (2 ) | 40. ( 3) |

(ලකුණු 1 x 40 = 40)

## පිළිතුරු පත්‍රය - II පත්‍රය

(01) (i) ජනසන්නිවේදනය (ලකුණු 2)

(ii) දෘශ්‍ය සන්නිවේදනය (ලකුණු 1x2=2)

(iii) කෝටි සංඛ්‍යාත ග්‍රාහක සහභාගිත්වය / අධිතාක්ෂණය භාවිතවීම / ප්‍රමාදිත ප්‍රතිපෝෂණය / ජනමාධ්‍ය මත සන්නිවේදනය සිදුවීම............ වැනි නිවැරදි වෙනත් පිළිතුරක් (ලකුණු 1x2=2)

(iv) අංකිතකරණය / වේගවත් සංදේශකරණය / ජාලගතකරණය / අන්තර් ක්‍රියාකාරීත්වය / අධිපාඨනීයත්වය / ස්වයංකරණය / දත්ත සංචිතකරණය. (සරල අදහස ඇති විට උපරිම ලකුණු ලබා දෙන්න) (ලකුණු 1x2=2)

(v) Facebook / web / e-mail / Twitter / (ලකුණු 1x2=2)

(vi) ප්‍රවෘත්තිමය ගුණාංග සහිතව ඡායාරූපයක් ලබා ගැනීම (ලකුණු 1x2=2)

(vii) රසඥතාව වර්ධනය / නිර්මාණාත්මක චින්තනය වර්ධනය / මාධ්‍ය විචාර දැනුම වර්ධනය / මාධ්‍යසාක්ෂරතා ඥානය වර්ධනය (ලකුණු 02)

(viii) තොරතුරු වේගයෙන් හුවමාරු කරගත හැකි වීම / තොරතුරු අතිවිශාල ප්‍රමාණයක් හුවමාරු කරගත හැකි වීම / ගෝලීය මට්ටමින් ක්‍රියාත්මක වීම / විවෘත ලෙස පරිහරණය කළ හැකි වීම / විවිධ සන්නිවේදන අරමුණු ඉටු කරගත හැකි වීම (ලකුණු 1x2=2)

(ix) සමානතාවක් = ප්‍රක්ෂේපණ උපකරණයක් වීම / බලශක්තිය අවශ්‍ය වීම
අසමානතා = පරිගණක ක්‍රියාවලිය OHP වලට අවශ්‍යනොවීම / චලන රූප පෙන්වීමට OHP නොහැකිවීම
(ලකුණු 02)

(x) අන් අය රැවටීමෙන් වැලකීම / වැරදි - අසත්‍ය තොරතුරු ජාලයට එක් කිරීමෙන් වැලකීම / අනවශ්‍ය ලෙස පෞද්ගලික තොරතුරු අන්‍යයන්ට ලබා නොදීම / සමාජ සදාචාරයට අනුකූලව භාවිත කිරීම / අන්අය ගේ පෞද්ගලිකත්වයට හානි නොකිරීම (ලකුණු 1x2=2)

(02) (i) රූපය ප්‍රමුඛවීම / මිත්‍යා විශ්වාස අන්තර්ගත වීම / ආකර්ශණීය බව වැඩිවීම
(ලකුණු ½ x2=1)

(ii) ගණකයන්ත්‍රයක් ලෙස භාවිතය / කැමරාවක් ලෙස භාවිතය / පටිගත කිරීම් හැකියාව / ගුවන්විදුලිය ශ්‍රවණයට හැකි වීම / අන්තර්ජාල පහසුකම් ලබා ගැනීමට හැකිවීම ................... වැනි වෙනත් නිවැරදි පිළිතුරකට උපරිම ලකුණු ලබා දිය යුතුය. (නම් කිරීමට ½ x2=1 විස්තර කිරීමට ල. 1 × 2 = 02)

(iii) ඉගෙනුම තාත්විකවීම / මතකය වර්ධනය / සිසු ප්‍රබෝධය වැඩි වීම / ගුරු - සිසු සම්බන්ධතා වැඩි වීම / සංකීර්ණ සංකල්ප සරලව කියා දීමට හැකි වීම.)

(සනාථ කිරීමටලකුණු 1 x 3 = 03 )

(iv) පුද්ගලාන්තර සන්නිවේදනයේ ලක්ෂණ දැක්විය යුතුය. කරුණු විස්තර කර තිබිය යුතුය.
(විස්තර කිරීමට ලකුණු 1 × 4 = 04)

(03) (i) ෂැනන් - වීවර් ආකෘතිය (ලකුණු 01)

(ii) අර්ථ හා මාධ්‍ය බාධක දෙවර්ගය පැහැදීම අපේක්ෂා කෙරේ.
(නම් කිරීමට පමණි ල. ½ × 2 = 01 විස්තර කිරීමට 1 ×2 = 02)

(iii) සන්දේශය තුළ විවිධාර්ථ තිබීම / වැරදි ලෙස තොරතුරු ගොනුකර සන්දේශ සැකසීම / සන්දේශයේ තොරතුරු විකෘති වී තිබීම / ග්‍රාහකයාගේ අත්දැකීම් පසුතලයේ නොගැළපීම
(නිදසුන් සහිතව පමණක් විස්තර කිරීමට 1 × 3= 03 නිදසුන් නැති විට ල. ½ බැගින් අඩුකළ යුතුය )

(iv) කරුණු විකෘති වීම / කරුණු සංස්කරණය වීම / අතිශෝක්තිමගින් තොරතුරු පුළුල් වීම / තොරතුරු වාරණය වීම / කරුණු කෙටි වීම
(ල. 1× 4 = 04 )

(04) (i) අතිශය ක්ෂණික මාධ්‍යයක් වීම / එතැනින් අසන්නට යොමු වීම / ශ්‍රාවකයා සමග පහසුවෙන් සම්බන්ධ වීම / භූගෝලීය බාධක විරලය / අඩුවියදම් මාධ්‍යයක් වීම (නම් කිරීමට ල. ½x2=1)

(ii) කලානුරූපීව අන්තර්ගතය වෙනස් වේ / මුද්‍රණශිල්පීය විවිධතා දැකිය හැකි විම / නිර්මාණශීලී ආකෘති භාවිතය / පෙළ හා රූප ගැලවීම ( නම් කිරීමට ල. ½ x 2=1 විස්තර කිරීමට ල. 1 × 2 = 2)

(iii) භාෂාරටා වෙනස් වීම / රසඥයතාව වෙනස් වීම / වැරදි ප්‍රතිරූප මැවීම / සංස්කෘතියේ අධිසංවේදී චර්යාවන් වෙනස් කිරීම / ප්‍රචන්ඩත්වයට හා කාමුකත්වයට යොමුවීම/ කාලකළමනාකරණයේ ගැටළු ඇතිවීම / පවුල් ආරවුල් ඇතිවීම / අධි පාරිභෝජනයට හුරුවීම / බටහිරකරණයට යොමු වීම / නිසරු ජීවිත අපේක්ෂා ඇති කර ගැනීම (පෙන්වාදීමට 1 × 3 = 03 )

(iv) තොරතුරු සැපයීම / අධ්‍යාපනය ලබා දීම / පෙළඹවීම / විනෝදාස්වාදය / සමාජානුයෝජනය / සංවාද හා සාකච්ඡා / සංස්කෘතික ප්‍රගමනය / සමාජ ඒකාබද්ධතාව .................... යන කරුණු විශේෂාංග ලිපි ආකෘතියට අනුව විස්තර කිරීම අනිවාර්යය වේ.

(රචනා කිරීමට 1 ×4 = 04 විශේෂාංග ලිපි ආකෘතිය නොමැති විට ල. ½ බැගින් අකුකළ යුතුය. )

(05) (i) එකග නොවේ: ක්ෂණිකව පුවත් දැන ගැනීමට හැකිවීම / ගබඩා කර ගැනීමේ පහසුව / නැවත නැවත කියවීමේ හැකියාව / තොරතුරු විෂය අනුව වර්ග කර තිබීම / යාවත්කාලීන කිරීමට හැකිවීම / ක්ෂණිකව පාඨක ප්‍රතිචාරදැක්වීමට හැකි විම යන කරුණු නිසා මුද්‍රිත පුවත්පතට වඩා විද්‍යුත් පුවත්පත වෙනස් වේ.

(ප්‍රකාශය සනාථ කිරීමට ½ x2=1)

(ii) එකග වේ : තොරතුරු වේගයෙන් ග්‍රහණය කර ගැනීමට හැකි වීම / තොරතුරු යාවත්කාලීන කිරීමේ පහසුව / වේගවත් ප්‍රතිචාරයට / විධිමත්ව හා ආරක්ෂාකාරීව ගබඩා කිරීමට හැකි වීම / වේගයන් තොරතුරු නිකුත් කිරීමට හැකිවීම (ප්‍රකාශය සනාථ කිරීමට ල. 1x2=2)

(iii) එකග නොවේ : වයස් මට්ටම/ සංස්කෘතිය / අධ්‍යාපනය / රසවින්දන ස්වභාවය / දැනුම හා අවබෝධය / විචාරශීලිත්වය ........ යන කරුණු නිසා මාධ්‍ය ග්‍රාහක විවිධතා ඇතිව තිබේ. මේ නිසා ප්‍රකාශයට එකග නොවේ.


(ප්‍රකාශය සනාථ කිරීමට ල. 1 x 3 = 3)

(iv) එකග වේ. අංකික හෙවත් ඩිජිටල් ඡායාරූපකරණ යේ විශේෂතා පහදමින් ප්‍රකාශය සනාථ කළ යුතුයි.

(ප්‍රකාශ සනාථ කිරීමට 1 × 4= 04))

(06) (i) ස්ත්‍රී - පුරුෂ සමාජ භාවය (නම් කිරීමට ල. 01)

(ii)




යන අවස්ථා (04) විස්තර කළ යුතුය (විස්තර කිරීමට ½ × 4 = 2නම් කිරීමට පමණක් ල. නොමැත)

(iii) අදාල සියලු විස්තර ඇතුළත්ව තිබීම / අනවශය දෑ ඇතුළත් නොවීම / රාමුව තුළ ඡායාරූපික වස්තූන් මනාව සංවිධානය වීම / උචිත කැමරා කෝණය / නිවැරදි ආලෝකය / නිවැරදි අනාවරණය / ඡායාරූපය සටහන් කර ගන්නා නිසි මොහොත (විස්තර කිරීමට ල. 1×3= 03)

(iv) අදහස් ප්‍රබලව ඉදිරිපත් කිරීමට ඇති හැකියාව / ග්‍රාහක විශ්වසනීයත්වය වැඩි කිරීම / ග්‍රාහක ආකර්ශණය පහසුවෙන් ලබා ගත හැකි වීම / පහසුවෙන් මුද්‍රණ තාක්ෂණයට අනුගත වීමට හැකි වීම / ඕනෑම අයෙකුට පහසුවෙන් තේරුම් ගැනීමට හැකි වීම. (සවිස්තරව දැක්වීමට 1 × 4= 04)

(07) (i) සමූහ සන්නිවේදනයේ ලක්ෂණ දෙකක් නම් කිරීම අපේක්ෂා කෙරේ. (නම් කිරීමට ල. ½ × 2 = 01)

(ii) **සාර්ථක බවට :** ඵලදායිකථන උපක්‍රම භාවිතය / ඉදිරිපත් කිරීමේ නිපුනතා සංවර්ධනය වීම / උචිත පරිදි මාධ්‍ය උපකරණ භාවිතය)

**අසාර්ථක බව :** සබකෝලය / නිසි පරිදි පූර්ව සූදානම් නොවීම / පළ පුරුදු බව අඩු කම / දේශනයේ අසංවිධිත බව (නම් කිරීමට ල. ½ × 2 = 01 - විස්තර කිරීමට ල. 1 × 2 = 02)

(iii) ග්‍රාහක මාධ්‍ය සාක්ෂරතාව වර්ධනයට / සංදේශයේ උඩුපෙළ හා යටිපෙළ කියාදීමට / මාධ්‍ය හා ග්‍රාහක සම්බන්ධතා වර්ධනයට / මාධ්‍ය කර්මාන්තය පවත්වාගෙන යාමට උපකාරී වීම / නිර්මාණකරුට සද්භාවයෙන් මග පෙන්වමිට / සන්දේශයේ සමාජ බලපෑම ග්‍රාහකයාට පෙන්වා දීමට / ........ තීරු ලිපි ආකෘතියට වචන 100 නොඅඩු පරිදි ලිවීම අනිවාර්යය වේ. (ල. 1 × 3 = 03) (ආකෘතියට අනුකූල නොවන විට ල. ½ බැගින් අඩු කරන්න.)


(iv) මාධ්‍ය මගින් ඉදිරිපත් කරන දේ අවබෝධ කර ගැනීමට / මාධ්‍ය මගින් සඟ වන දේ අවබෝධකර ගැනීමට / ජනමාධ්‍ය වල යටි න්‍යායපත්‍ර අවබෝධකර ගැනීමට / මාධ්‍ය සාක්ෂරතා හා මාධ්‍ය විචාර දැනුම ප්‍රවර්ධනයට / ග්‍රාහක පොළඹවා ගැනීමේ සූක්ෂම උපාය මාර්ග හඳුනා ගැනීමට (පෙන්වා දීමට ල. 1 ×4= 04)


අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට


www.lol.lk
Learn Ordinary Level


LOL.lk online Book Store


අමතන්න - 071 777 4440/0756999990/071 8540371







































# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371


## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## කෙටි සටහන් පොත්




මිටිටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

# PAST PAPERS WIKI

## ප්‍රශ්නපත්‍ර පොත් ගෙදරටම ගෙන්ව ගන්න ඔන්ලයින් ඕඩර් කරන්න

## WWW.LOL.LK වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
VISA MasterCard DISCOVER
NO PAYPAL ACCOUNT NEEDED!

# ONLINE BOOK STORE

An evening of fun for young readers